**මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය කිරීමේ පදනම කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ප්‍රමිත අංක 3.18(ඇ) ප්‍රකාර රු.427,619,015 ක් වූ ස්ථාවර තැන්පත් ජංගම වත්කම් ලෙස දක්වනු වෙනුවට ජංගම නොවන ආයෝජන යටතේ දක්වා තිබුණි. | 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වාර්තාව සකස් කිරීමේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව දන්වමි. | නිවැරදිව වත්කම් වර්ගීකරණය කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පරිගණක මෘදුකාංග හා පාරවල් බෝක්කු යන වත්කම් වෙනුවෙන් රු.18,269,920 ක් ක්ෂය කළ යුතු වුවද රු.5,824,005ක් පමණක් ක්ෂය කර තිබුණු හෙයින් ක්ෂය රු.12,445,895 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | විගණනය සමග සාකච්ඡා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි ලෙස ක්ෂය ගණනය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.5,415,707 ක් හා ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ශේෂය රු.18,583,712 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | නැවත පරීක්ෂා කර බලා නිවැරදි කර විගණනය සඳහා ඉදිරිපත් කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් රු.81,711,389 ක් වූ නමුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ රු.81,372,055 ක් ලෙස දක්වා තිබුණු හෙයින් සභාවේ මුළු ආදායම රු.339,334 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ හා මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ උපලේඛන අනුව ගිණුම් ශේෂ 04කට අදාළව රු.38,920,917 ක වෙනසක් විය. | ලේඛන නැවත පරීක්ෂා කර නිවැරදි කරමින් පවතින බව. | වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.15,919,486 ක් වූ ගිණුම් ශේෂ 03ක්, ලෙජර් ගිණුම් සහ කපා හැරීම සඳහා වූ සභා අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | පරීක්ෂා කර බලා විගණනය වෙත ඉදිරිපත් කරන බව | විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | රු.15,284,971 ක් වූ සභාවේ වත්කම් සම්බන්ධ ලේඛන නඩත්තු කර නොතිබුණු අතර ඉඩම් සම්බන්ධ ඔප්පු, පිඹුරු තහවුරු කර ගැනීමට කිසිදු ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය. | යාවත්කාලීන කිරීම සහ 2021 වර්ෂයේ සිට නැවත වත්කම් ප්‍රත්‍යාගණනය කර ලේඛන ගත කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව. | ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති | | | | |
| | (i) | 12(IX) රීතිය හා මු. රෙ. 395(ඇ) | රාජ්‍ය බැංකු 02 ක පවත්වාගෙන යන ජංගම බැංකු ගිණුම් 02 ක් වෙනුවෙන් ඒකාබද්ධ බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර තිබුණි. | 2023.06.01 දින සිට ලංකා බැංකුවේ ජංගම ගිණුම වසා රු. 233,258.07 ක මුදල මහජන බැංකුවේ ජංගම ගිණුමට මාරු කළ බව. | යොමුගත රීතියට අනුකූල විය යුතුය. |
| | (ii) | 48 රීතිය | වැඩබිම්වල පවතින රු.648,903 ක් වූ තොග සම්බන්ධ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | වර්ෂ අවසාන භාණ්ඩ සමීක්ෂණය මගින් පරීක්ෂා කර භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ අමුණා ඇති බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු. රෙ. 571 | සභාව සතු රු.14,468,973 ක් වූ වර්ෂ දෙක ඉක්ම වූ තැන්පත් ශේෂය නියාදනය කර නොතිබුණි. | ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | යොමුගත රෙගුලාසියට අනුකූල විය යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 24 දිනැති අංක LGD/09/2019(I) දරන පළාත් පාලන චක්‍රලේඛය | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙහි ආකෘති ප්‍රකාරව සේවක ණය සම්බන්ධව වාර්ෂිකව ණය සීමා අනුමත කර ගෙන නොතිබුණි. | සේවක ණය සම්බන්ධව වාර්ෂිකව ණය සීමා අනුමත කර ගැනීමට කටයුතු කරන බව. | යොමුගත චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 257,692,865 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.171,652,556 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 පෙබරවාරි සිට 2022 අප්‍රේල් දක්වාම ක්‍රෙඩිට් කාඩ් වෙනුවෙන් ලැබිය යුතු මුදල් රු.13,310ක් ද වැඩිපුර ලැබුණු රු.6,832 ක් ද අන්තර්ජාල ගෙවීම් සඳහා අඩුවෙන් ලැබුණු රු.30,072 ක් හා වැඩිපුර ලැබුණු රු.14,025 ක් ද බැංකුව සමඟ පරීක්ෂා කර නිවැරදි කිරීම් මත අදාල ගිණුම් ගත කිරීම් සිදු කර නොතිබීම නිසා බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී දිගින් දිගටම දක්වා තිබුණි. | හැකි ඉක්මනින් මෙම ශේෂයන් බැංකු සැසඳුම තුල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | බැංකුව සමඟ පරීක්ෂා කර නිවැරදි කිරීම් මත අදාල ගිණුම් ගත කිරීම් සිදුකළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුමෙහි 2021 දෙසැම්බර් 31 දිනට බැංකුව ලද ක්‍රෙඩිට් කාඩ් (ප්‍රධාන කාර්යාලය) රු.24,675 ක් සෘජු බැර ලෙස පෙන්වා තිබූ නමුත් විගණිත දින වන 2023 අප්‍රේල් 06 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හැකි ඉක්මනින් මෙම මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | තොරතුරු සොයා නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | | 000' | 000' | 000' | 000' | 000' | 000' | 000' | 000' |
| (i) | වරිපනම් හා බදු | 35,220 | 29,735 | 25,666 | 36,938 | 34,779 | 39,143 | 36,456 | 31,272 |
| (ii) | කුලී | 1,516 | 1,430 | 1,430 | 603 | 2,586 | 2,693 | 2,516 | 1,079 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,110 | 1,180 | 1,180 | - | 910 | 1,253 | 1,279 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,131 | 220 | 692 | 179 | 569 | 682 | 624 | 220 |
| | | 38,977 | 32,565 | 28,968 | 37,720 | 38,844 | 43,771 | 40,875 | 32,571 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජංගම වත්කම් තුල පෙරගෙවුම්/ අත්තිකාරම් ශේෂය තුල වසර 20 ඉක්මවූ රු. 784,907 ක ශේෂයක් පැවතියද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විශේෂිත වූ කමිටුවක් පත් කර මෙම ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂ කිහිපයක සිට අක්‍රීයව පැවති රු.233,258 ක් ඵලදායි ලෙස ආයෝජනය කර නොතිබුණි. | මෙම මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කරන බව. | අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් 2018 වර්ෂයේ සිට අවස්ථා 3 කදී රු.6,750,000 ක මුදලක් වැය කරමින් පරිගණක මෘදුකාංගයක් ලබාගෙන තිබූ අතර එම මෘදුකාංගය මගින් සභාවේ ප්‍රධාන කාර්යයන් 13 ක් සඳහා පහසුකම් ලබාගැනීමට හැකියාව ඇති බව දන්වා ඇතත් එම කිසිදු කාර්යයක් සම්පූර්ණ කර ගැනීමට මෘදුකාංගයේ දායකත්වයක් නොමැති බව නිරීක්ෂණය විය. | සියළුම කාර්යයන් සඳහා මූලික කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව වෙත මෘදුකාංග මිලදී ගැනීමේදී අවශ්‍යතා නිවැරදිව හඳුනාගත යුතු අතර මිලදී ගත් මෘදුකාංග භාවිතයට ගත යුතුය. |
| (ඈ) | තොග ගිණුම් තැබීමේදී භාණ්ඩ ලැබීම්පත් (GRN) පදනම් කරගෙන ගබඩාට ලැබෙන තොග සටහන් කිරීමත්, භාණ්ඩ නිකුතු නියෝග (Issue Order) මත ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීමත්, නිවැරදි මිල ක්‍රමයට අනුව වැය විෂයයෙහි හරට සටහන් කිරීමත් සිදුකළ යුතු වුවද සභාව විසින් එවැනි පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දෙන ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | විධිමත් පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී පළාත් සභා අරමුදලින් රු.2,000,000ක් හා සභා අරමුදලින් රු.4,800,000 ක් වශයෙන් එකතුව රු.6,800,000ක් වැය කරමින් ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ සූර්ය පැනල පද්ධතියක් සවිකර තිබුණි.<br>මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබූ අතර ව්‍යාපෘති වාර්තාවක් ද පිළියෙළ කර නොතිබුණු අතර ශුද්ධ ගිණුම්කරණ ක්‍රමවේදය (Net Accounting) හා නෙට් ප්ලස් ක්‍රමය (Net Plus) අතුරින් සභාවට වාසිදායක ක්‍රමවේදය කුමක්ද යන්න ඇගයීමට ලක් කර නොතිබුණි. | ඉදිරියේදී විගණනයෙන් පෙන්වා දෙන පරිදි කටයුතු කරන බව. | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර සභාවට වාසිදායක ක්‍රමවේදය කුමක්ද යන්න ඇගයීමට ලක් කළ යුතුය. |
| (ii) | නඩත්තු හා සේවා කොන්දේසි ද වගකීම් කාලය ද ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. | සේවා සැපයීමෙන් පසු නඩත්තු කාලසීමාව වසර 05 ක් ලෙසද දන්වා ඇත.එම ප්‍රසම්පාදන ලියවිල්ලේ පළමු කොටස ගිවිසුමට අලවා ඇති අතර , දෙවනි කොටස ගිවිසුමට ඇලවීමට අතපසු වී ඇති බව. | නඩත්තු හා සේවා කොන්දේසි ද වගකීම් කාලය ද ගිවිසුමට ඇතුළත් කළ යුතුය. |
| (iii) | 2020, 2021 වර්ෂවලදී විදුලි උත්පාදනය ඒකක 1000 ක් ඉක්මවා තිබුණ ද 2021 නොවැම්බර් සිට 2022 ජූලි දක්වා නිෂ්පාදනය ඒකක 400- 600 අතර ප්‍රමාණයන් වී තිබුණි. වර්ෂ 07 ක් ඉක්මවීමටත් පෙර මෙසේ උත්පාදනය වන විදුලි ඒකක ප්‍රමාණයේ අඩුවීමට හේතු අනාවරණය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර සේවා හා නඩත්තු කටයුතු සිදු කෙරෙන බවට වාර්තා වී නොතිබුණි. | සෝලා පද්ධතිය මිලදී ගත් ආයතනය. සෝලා පද්ධතිය පරීක්ෂා කිරීමෙන් පසු සෝලා පැනල් එක මත දියසෙවල බැඳී ඇති බව. | විදුලි ඒකක ප්‍රමාණයේ අඩුවීමට හේතු අනාවරණය කර ගත යුතු අතර සේවා හා නඩත්තු කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | රු.6,800,000 ක ආයෝජනයක් මගින් අවු 25 ක් තුලදී විදුලි බිල ගෙවීම පිළිබඳව වූ අපේක්ෂා කළ අරමුණ කරා ලඟාවීමට නොහැකි වී තිබුණි. | මේ සම්බන්ධව තව දුරටත් සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා බව. | අරමුණ කරා ලඟාවීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | උඩුගම්පල ඇවිදින මංතීරුව, ආදාහනාගාරය හා මින්මැදුර ඉදිකිරිමේ කාර්යය සඳහා රු.1,314,777 ක් හා සෝලා පද්ධතිය සැපයීමට රු.4,884,000 ක් ලෙස මුළු එකතුව රු.6,198,477 ක වැය කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | මාසිකව රු.8,000 කට ආසන්න මුදලක් සභා ආදායමට උපයාගත හැකිව තිබියදී ශුද්ධ ගිණුම්කරණ ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2021 සැප්තැම්බර් සිට 2022 ජූලි වන විට උත්පාදනය කළ ඒකක ප්‍රමාණය 600-500 අතර පරාසයක පහල අගයක් ගෙන තිබුණි. | තව දුරටත් කරුණු සොයා බලා ඉදිරි කටයුතු සිදු කරන බව. | සභාවට ආදායමක් උපයාගත හැකි වන පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) | වර්ෂ 02 ක් සඳහා නොමිලයේ සපයනු ලබන නඩත්තු හා සේවා සැපයීම පිළිබඳව සාක්ෂි නොවීය. | වගකීම් කාලය අවසන් වී ඇති බැවින් නැවත සේවා ගිවිසුම අලුත් කර ගැනීමට කටයුතු කර ඇති බව | නඩත්තු හා සේවා සැපයීම පිළිබඳව සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් අදියරයන් වශයෙන් සේවා පියස් හා ප්‍රජාශාලා ඉදිකිරීම් 09ක් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | මුළු පිරිවැය ඇස්තමේන්තු හා මූලික සැලැසුම් සකස් කිරීමකින් තොරව ද ගොඩනැගිලි සැලසුම්වලට සභාවේ අනුමැතිය නොමැතිව ද ඉදිකිරීම් පිළිබඳව නිසි අධීක්ෂණයකින් තොරව ද ඉදිකිරීම් කර තිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කරන බව. | මුළු පිරිවැය ඇස්තමේන්තු හා මූලික සැලැසුම් සකස් කළ යුතු අතර ගොඩනැගිලි සැලසුම්වලට සභාවේ අනුමැතිය ලබා ගෙන ඉදිකිරීම් පිළිබඳව නිසි අධීක්ෂණයකින් ඉදිකිරීම් කළ යුතුය. |
| (ii) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රජාශාලාවන් හා සේවාපියස් ඉදිකිරීම් ආරම්භ කර වසර 10 කට අධික කාලයක් ගතවී තිබුණද, 2022 අගෝස්තු 20 දින වන විටත් එම ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | ඉදිරියේදී මුදල් ලැබෙන ආකාරයට ඉක්මනින් වැඩ නිම කිරීමට කටයුතු කරන බව. | නියමිත කාලය අවසන් වීමට පෙර ඉදිකිරීම් නිම කළ යුතුය. |
| (ආ) | 2009 වර්ෂයේදී ඇස්තමේන්තුව රු.1,200,000ක් වූ දොරණගොඩ දකුණ ග්‍රාමසේවා වසමේ දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස සේවා පියස ඉදිකිරීම ආරම්භ කර තිබූ අතර 2022 සැප්තැම්බර් 25 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හා මූලික සැලැස්මක් සකස් කර නොතිබුණු අතර ගොඩනැගිලි සැලැස්මක් ද අනුමත කිරීමකින් තොරව රු.1,145,446 ක් වැය කර ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. | මුළු පිරිවැය ඇස්තමේන්තු හා සැලැස්මක් සකස් කිරීම ඉතා අපහසු බව. | මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හා මූලික සැලැස්මක් සකස් කළ යුතු අතර ගොඩනැගිලි සැලැස්මක් අනුමත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොදු නිෂ්පාදන අලෙවිකිරීමේ මධ්‍යස්ථානයකට අවශ්‍ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.4,072,449 කට ගිවිසුම්ගත වී තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | ගොඩනැගිලි සැලැස්ම සභාව විසින් අනුමත කර නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කරන බව. | ගොඩනැගිලි සැලැස්ම සභාව විසින් අනුමත කරගත යුතුය. |
| (ii) | Ready mix concrete සඳහා අවශ්‍ය SLS 1144-1997 වූ සහතිකය ඉදිරිපත් කර නොතිබුණි. | රෙඩිමික්ස් කොන්ක්‍රීට් සඳහා කිසිදු ආයතනයක් SLS සහතික ලබාගෙන නොමැති බව. | SLS 1144-1997 වූ සහතිකය ඉදිරිපත් කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පත්තඩුවන උප කාර්යාලයේ ආපදා ණය ශේෂය තුල විශ්‍රාම ගිය අයෙකුගේ රු.149,517 ක ණය ශේෂයක් හා යුතු රු. 24,821ක සේවකයින් 04දෙනෙකුට අදාළ අය නොවන ණය ශේෂයක් ඇතුලත්ව තිබුණි. | විශ්‍රාම වැටුප් ගෙවීමේදී මෙම සභාවට අයකර එවීම සඳහා නොඉල්ලුම් සහතිකයට ඇතුළත් කර ඇති බව හා අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |